# එලදායී අධ්‍යාපනයක් උදෙසා ශිෂ්‍ය විවිධත්වය හසුරුවාගැනීමේ දී සංගීත ගුරුවරයාගේ කාර්යභාරය පිළිබඳ විමසුමක්

පී. ඒ. අමිල මදුසංක

In order to create a complete person it is essential to associate his or her hereditary reflexes and abilities with educational input from the environment. Such a decisive responsibility of moulding a balanced personality is provided by the "teacher". Therefore, it is the professional teacher who realises the true spirit of education leading to social facilitation. To deliver a sustainable education, he has to posses a sound knowledge of the goals of education along with the student community as one of its stakeholders. In this sense we identify the importance of the music teacher who addresses the affective domain of the students through a lively teaching - learning process than any teacher of any other subject. Therefore this research study aims at studying the strategy employed by the music teacher to identify the variations of the learners.

© පී. ඒ. අමිල මදුසංක

සංස්. පී. ඒ. අමිල මදුසංක, ජයමල් ද සිල්වා, දිල්ෂාන් මනෝජ් රාජපක්ෂ, චන්දන රුවන් කුමාර, එච්. ඒ. ගිහාන් මධුසංඛ, නන්දුලා පෙරේරා
'ප්‍රභා' ශාස්ත්‍රීය සංග්‍රහය, සිවු වැනි කලාපය - 2014/2015
මානවශාස්ත්‍ර පීඨය, කැලණිය විශ්වවිද්‍යාලය

## අධ්‍යාපන අරමුණු හා සෞන්දර්ය අධ්‍යාපනය

පරිපූර්ණ මිනිසෙකු බිහි වීමට නම් ඔහු ආරයෙන් උරුම කරගත් ප්‍රතීක (Reflex) හැකියාවන් මෙන් ම පරිසරය ඇසුරින් ලබාගන්නා විධිමත් හා නොවිධිමත් අධ්‍යාපනය ද අතිශයින් වැදගත් වන්නේ ය. එවැනි සමබර පෞරුෂයක් සහිත පුද්ගලයෙකු බිහි කිරීමේ භාරදූර කාර්යය සිදු කරනු ලබන්නේ බාහිර පරිසර සාධකයක් වන ගුරුවරයා ය. එබැවින් සමාජය සුසාධ්‍යකරණය කිරීමේ පෙර ගමන්කරු වන්නේ අන් කවරෙකුවත් නොව අධ්‍යාපනයේ නිවැරදි වටිනාකම හඳුනාගත් වෘත්තිකභාවය ලද ගුරුවරයා ය. නිවැරදි අධ්‍යාපනයක් ලබාදීම සඳහා අධ්‍යාපනයේ මුඛ්‍ය පරමාර්ථය මෙන් ම එහි ප්‍රතිලාභ ලබන ශිෂ්‍ය ප්‍රජාව පිළිබඳ ව ද ප්‍රාමාණික අවබෝධයක් ඔහු සතු විය යුතු ය. බී. එස්. බ්ලූම්ගේ අධ්‍යාපන අරමුණු වර්ගීකරණයට (1956) (Txonomy of Educational Objectives) අනුව පුද්ගලයෙකු කිසියම් අවස්ථාවක ලබන අධ්‍යාපනය, ඒ පුද්ගලයාගේ සමස්ත ජෛවීය, ශාරීරික හා මානසික ක්‍රියාකාරීත්වයේ අභිවෘද්ධියට ඉවහල් වේ. එම වර්ගීකරණයන් බ්ලූම් මෙසේ දක්වා ඇත.

1. විඥාන හෙවත් ප්‍රජානන ක්ෂේත්‍රය (Cognitive Domain)
2. ආවේදන හෙවත් වින්දන ක්ෂේත්‍රය (Affective Domain)
3. මනෝචාලක ක්ෂේත්‍ර (Psycho - Motor Domain)

ප්‍රජානන ක්ෂේත්‍රය මඟින් අපේක්ෂා කරනුයේ දැනුම (Knowledge) වර්ධනය කිරීම උදෙසා වන අධ්‍යාපනය වන අතර ආවේදන ක්ෂේත්‍රය ඔස්සේ ආකල්ප (Attitude) සංවර්ධනය අපේක්ෂා කෙරේ. මනෝචාලක ක්ෂේත්‍රය සංවර්ධනය කිරීම යනු කුසලතා (Skills) වර්ධනයයි.

වර්තමාන අධ්‍යාපන ක්‍රියාවලිය ක්‍රියාත්මක වනුයේ බ්ලූම්ගේ මෙම අධ්‍යාපන අරමුණු වර්ගීකරණයේ පදනම මත පිහිටා ය. එය සමස්ත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ පදනම් සාධකය වන හෙයින් සියලු ම විෂයමාලා ඊට අනුරූපී ලෙස සකස් වේ. ඒ අතුරින් ගණිතය, විද්‍යාව වැනි විෂයයන් ප්‍රජානන ක්ෂේත්‍රයේ වර්ධනයට වැඩි නැඹුරුවක් දක්වයි. නව විෂය මාලාවට එක්වූ තාක්ෂණික විෂයයන්

මනෝ චාලක ක්ෂේත්‍ර වර්ධනයට වඩා වැඩි නැඹුරුවක් පෙන්වන අතර ම සෞන්දර්ය විෂයයන් ආකල්ප වර්ධනය සඳහා ප්‍රබල දායකත්වයක් සපයන විෂයයන් වේ.

සෞන්දර්ය අධ්‍යාපනයට අයත් වන චිත්‍ර, නර්තනය, සංගීතය, නාට්‍ය හා රංගකලාව වැනි විෂයයන් ඉගැන්වීම පාසල්වල 6 ශ්‍රේණියේ සිට 13 ශ්‍රේණි දක්වා ක්‍රියාත්මක වන අතර විශ්ව විද්‍යාල වැනි උසස් අධ්‍යාපන ආයතනවල තවදුරටත් ගැඹුරින් හැදෑරීමට අවස්ථා සලසා දී තිබේ. සෞන්දර්ය අධ්‍යාපනයට අයත් විෂයයන් මුඛ්‍ය වශයෙන් ආවේදන ක්ෂේත්‍රයේ අරමුණු උදෙසා ක්‍රියාකාරී දායකත්වයක් සපයන්නා සේ ම ප්‍රජානන හා මනෝචාලක ක්ෂේත්‍ර ද ප්‍රමාණාත්මක ව පෝෂණය කරයි. සෞන්දර්ය අධ්‍යාපනයේ මූලික පරමාර්ථය ආකල්ප පෝෂණය කිරීම මඟින් භාවමය තුලනයක් (Emotional Balance) ඇති කිරීමයි. එසේ ම න්‍යායාත්මක දැනුම හා ක්‍රියාකාරී ඉගෙනුම් ක්‍රම හේතුවෙන් ආවේදන ක්ෂේත්‍රය මෙන් ම අනෙකුත් ක්ෂේත්‍රයන් ද සමාන්තර ව පෝෂණය වන හෙයින් සමතුලිත අධ්‍යාපනයක් (Well Balanced Education) ශිෂ්‍යයා අත්පත් කර ගනී.

එහෙත් අනෙකුත් විෂයයන් මෙන් නොව ආවේදන ක්ෂේත්‍රයේ අරමුණු සාක්ෂාත් කර ගැනීම අපහසු කාර්යයක් බව මේ පිළිබඳ අධ්‍යයන සිදු කළ ක්‍රැත්වෝල් (D. R. Krathwoll) ඇතුලු පිරිස පෙන්වා දෙයි. මන්ද ප්‍රජානන ක්ෂේත්‍රය මූලික කරගත් අරමුණු අත්පත් කර ගැනීමට ක්ෂණික මිනුම් ක්‍රම පැවතිය ද ආවේදන ක්ෂේත්‍රය මැන බැලීමට සරල ක්‍රියාදාමයක් නොවීම ය. ආවේදන අරමුණු සංවිධානය සඳහා බලපාන ප්‍රධාන සිද්ධාන්තය නම් හැඟීම් චරිතායනය හෙවත් අභ්‍යන්තරීකරණය වේ. අභ්‍යන්තරීකරණය යනු වින්දනය ඔස්සේ ලබාගන්නා අධ්‍යාපනයෙන් ලබන දැනීම හා වැටහීම නිසා ආකල්ප, ප්‍රතිපත්ති, අනුදැක්ම, පැවතුම්, පුද්ගල සාරධර්ම ආදි අගයන් විනිශ්චය කිරීම හා චරිතමය පැවතුම් තීරණය කිරීමට පුද්ගල අභ්‍යන්තරයේ සිදුවන ඓන්ද්‍රීය එකතුවීම වේ.[2] එබැවින් සෞන්දර්ය විෂයන් ඉගෙනුමෙන් අත්කර ගන්නා දීර්ඝ කාලීන ප්‍රතිලාභ, සම්භවන හා සම්පිණ්ඩන හෙවත් පාඩම සමගාමී ව හා පාඩම අවසානයේ කරනු ලබන ඇගයුම් මඟින් තක්සේරු කරගත හැකි ප්‍රමාණයට වඩා අතිමහත් වේ. පූර්ණ කාලීන කැපවීමකින් හා ශිෂ්‍ය ප්‍රජාවගේ ආකල්ප

හා කුසලතා හොඳින් අවබෝධ කොටගෙන ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ යෙදෙන වෘත්තීය පුහුණුවක් ලත් සෞන්දර්ය ගුරුවරයෙකුට පමණක් තම ශිෂ්‍ය ප්‍රජාවගේ යහපත උදෙසා විශ්වසනීය අඩිතාලමක් දැමිය හැකි වේ.

ඉගෙනීම යනු උපස්ථම්භනය කරන ලද පුහුණුවේ ප්‍රතිඵලයක් වශයෙන් ඇති වන සාපේක්ෂ වශයෙන් නිත්‍ය වූ චර්යා වෙනස් වීමේ ශක්‍යතාවයයි. (Geldard and Marxquis) [3] එනම් ඉගැනුම සිදුවන්නේ උපස්ථම්භන හෙවත් චර්යා ශක්තිමත් කිරීමට උපකාර වන ආනුශංගික පෙළඹවීමේ ප්‍රතිඵලයක් ලෙස ය. එහි දී ඉගැනුම යනු චර්යාවේ වෙනස නොවන බවත් ඉගැනුමේ ප්‍රතිඵලයක් වශයෙන් චර්යාමය වෙනස බාහිර සමාජයට ප්‍රකට වන බවත් ගෙල්ඩාඩ් හා මාර්කුයිස් පෙන්වා දෙයි. මෙම ක්‍රියාවලියේ දී උපස්ථම්භනය ධනාත්මක ව ලබා දීමට අතිශයින් ම උපකාර කරනුයේ ගුරුවරයා ය. ගුරු උපදෙස් මත පුහුණුවන ශිෂ්‍යයා හිස (Head), හදවත (Heart) හා අත (Hand) යන (3H) සාධක ත්‍රිත්වය පිළිබඳ සාධිත තත්ත්වයට පත්වූ විට සමාජය තුළ පෙන්නුම් කරන චර්යාමය හැසිරීම් ද වර්ධනීය අයුරින් ඉදිරිපත් කරයි. ඉහත සාධක 3 හි ම සංවර්ධනය සෞන්දර්ය අධ්‍යාපනයෙන් ලබාදෙන අතර සංගීත විෂය මූලික කරගත් ගුරුවරයා ශිෂ්‍ය විෂමතා පිළිබඳ මනා අවබෝධයෙන් යුතුව ක්‍රියා කරන ආකාරය විමසා බැලීම කාලෝචිත ය.


පන්ති කාමරයේ ඉගැනුම් ක්‍රියාවලියේ යෙදෙන ශිෂ්‍යයෝ විවිධ බුද්ධි මට්ටම් පෙන්නුම් කරන අය වෙති. ඇමරිකන් ජාතික මනෝ විද්‍යාඥයෙකු වූ හොවාර්ඩ් ගාර්ඩ්නර් විසින් බහුවිධ බුද්ධි න්‍යාය (Multiple Intelligence Theory) (1984) ඉදිරිපත් කරමින් පුද්ගල බුද්ධිය විෂම වන බවත්, ඒ අනුව විවිධ දක්ෂතා සෑම පුද්ගලයකු තුළ ම විවිධාකාරයෙන් පවතින බවත් පෙන්වා දී තිබේ. පන්ති කාමරයේ විවිධ වූ බුද්ධි මට්ටම් වල දරුවන්ට විවිධ වූ විෂයයන් උගන්වන ගුරු භූමිකා අතුරින් සංගීත ගුරුවරයා වනාහි සංගීතය හා රිද්මයානුකූල බුද්ධිය (Music - Rhythmic Intelligence) ආරයෙන් හා පරිසරයෙන් උරුම කරගත් විශිෂ්ට හැකියාවක් සහිත මඟ පෙන්වන්නෙකි. ඔහුගේ අධ්‍යාපනය කාර්යය වනුයේ විශිෂ්ට හැකියාවන් සහිත ආවේදනයට ප්‍රමුඛස්ථානයක් ලබාදෙන යහපත් දරු පරපුරක් බිහි කිරීම ය. සංගීත

ගුරුවරයාට පන්ති කාමරයේ දී හමුවන විවිධ බුද්ධි මට්ටම්වල සිසුන් අතර සුහග සිසුහු මෙන් ම අධ්‍යාපනික අවබෝධය අඩු මුග්ධ සිසුහු ද සිටිති.

සංගීත විෂය තුළ දී ශිෂ්‍යයාගේ විෂය ග්‍රහණ හැකියාව වර්ධනය කරමින් සම්ප්‍රජානන (Awereness), ග්‍රහණ කැමැත්ත (Willingness to Receive) හා වරණ අවධානය (Selecfed Attention) ලබා ගැනීම අතිශයින් වැදගත් වේ. මන්ද ආවේදන ක්ෂේත්‍රයේ ග්‍රහණ අවස්ථාවට අයත් ප්‍රාථමික අවස්ථා ත්‍රිත්වය ඒවා වන බැවිනි. ග්‍රහණය යනු කලා විෂයයන් කෙරෙහි ශිෂ්‍යයා දක්වන මුල් ම ප්‍රතිචාරය යි. එනම් සංගීතය වැනි විෂයයන් කෙරෙහි ශිෂ්‍යයා සංවේදී වීම හා හුරු වීම යි. සම්ප්‍රජානනය යනු සංගීත විෂය කෙරෙහි ශිෂ්‍යයා සතු කරගන්නා දැනීම යි. ග්‍රහණ කැමැත්ත යනු විවිධ ප්‍රබෝධක හා සංසිද්ධීන් ඉවසා දරා ගැනීමට හුරු කිරීම ය. වරණ අවධානය යනු කිසියම් ප්‍රබෝධකයක විවිධ අංශ කෙරෙහි වෙන් වෙන් ව යොමු කරලීම යි. උදාහරණ වශයෙන් නුර්ති ගීයක් ගත් විට එහි ස්ථායි, අන්තරා, අතුරු වාදන, සංගීත භාණ්ඩ හා එම භාණ්ඩවලින් ගොඩනගන රිද්මය ආදි වශයෙන් වෙන් වෙන් ව අධ්‍යයනයට යොමු කරවීම පෙන්වා දිය හැකි ය. මේ අනුව ඉගැනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ දී අතිශය භාරදූර කර්තව්‍යයක් ඉටු කරන සංගීත ගුරුවරයා ඉහත සඳහන් ග්‍රහණ අවස්ථාව පූර්ණය කරගැනීමට ප්‍රායෝගික ක්‍රියාකාරකම්, දෘශ්‍ය ආධාරක මෙන් ම අධ්‍යාපනික තාක්ෂදීක මෙවලම් සියල්ලක් ම පාහේ භාවිතයට ගනී. එසේ ම අධ්‍යාපනය සැපයීමේ දී සංගීත ගුරුවරයා විසින් පන්ති කාමරයේ දී හඳුනාගන්නා තම ශිෂ්‍ය ප්‍රජාව බුද්ධි වර්ගය අනුව වර්ගීකරණය කොට ඊට අනුරූපීව ඉගෙනුම් ශෛලිය හසුරුවා ගනු ලබයි.

## 01. බුද්ධි ඵලය හා ප්‍රමත ව්‍යාප්ති වක්‍රය

යම් රටක බුද්ධි පරීක්ෂණ මෙහෙයවා ඊට අනුරූපී ව ලබාගන්නා ලකුණු වර්ගීකරණය කිරීමෙන් බුද්ධිය පිළිබඳ වර්ගීකරණයක් සිදු කිරීමට බටහිර මනෝවෛද්‍යවරුන් ක්‍රියා කොට ඇති අතර එම දත්ත කිසියම් වූ ප්‍රමත ව්‍යාප්තියකට අනුව දැක්වීමෙන් ප්‍රමත ව්‍යාප්ති වක්‍රය නිර්මාණය කොට තිබේ.





**ප්‍රමත ව්‍යාප්ති වක්‍රය**[4]

සංගීත ගුරුවරයා මෙම සංකල්ප පිළිබඳ වෘත්තීය අධ්‍යාපනයේ දී හදාරා තිබීම නිසා ශිෂ්‍ය ප්‍රජාවට ලැබෙන ප්‍රතිලාභ බහුල ය. ඒ අනුව බුද්ධි ඵලය 70% ට අඩු ලෝක ජනගහනයෙන් 2% ක් වන හීන බුද්ධිය සහිත මුග්ධ සිසුන් වහා හඳුනාගන්නා ගුරුවරයා, සාමාන්‍ය පන්ති කාමර අධ්‍යාපනයෙන් විශේෂ අධ්‍යාපනය සඳහා එම දරුවන් වහා ම යොමු කරයි. එසේ ම ශිෂ්‍යයෙකුට යම් කාර්යයක් නිවැරදි ව ග්‍රහණය කරගැනීමට නොහැකි වූ කළ 'මෝඩයා, මුග්ධයා' ලෙස ආමන්ත්‍රණය කිරීමෙන් වැළකීමේ මනෝවිද්‍යාත්මක අවබෝධය සංගීත ගුරුවරයා සතු වේ. මෙහිදී සංගීත ගුරුවරයා අවබෝධ කරගන්නා ප්‍රධාන කරුණ නම් ශිෂ්‍යයින් විෂම බවත්, එක් විෂයකට දක්ෂ සිසුවා අනෙක් විෂයකට දුර්වල විය හැකි බවත්, ඇතැම් විෂයකින් සුහග හා අතිදක්ෂ වන ශිෂ්‍යයෙක් තවත් විෂයක දී සාමාන්‍යයෙන් දුර්වල හැකියා ප්‍රදර්ශනය කළ හැකි බවත් ය. එසේ ම තම විෂයට මතු කළ නොහැකි වෙනත් දක්ෂතා වෙනත් විෂයක දී වෙනත් ගුරුවරයෙකුට මතුකොට ගත හැකි බව සංගීත ගුරුවරයා වටහා ගනී. එබැවින් ඔහු දරුවෙකුගේ නොහැකියා ව සමච්චලයට ලක් නොකිරීමට වග බලාගනී.

## 02. මොළයේ දකුණ / වම ප්‍රබලත්වය (Right - Left - Brain Dominance)

වර්ෂ 1980 දී අධ්‍යාපන ක්ෂේත්‍රයට හා විද්‍යාත්මක ක්ෂේත්‍රයට අතිශය වැදගත් සොයා ගැනීමක් සිදුවිය. එය රොබෙස්ට් ඔර්න්ස්ටේන (Robest Ornstein) සහ රෝජර් ස්පේරි (Roges Sperry) යන විද්‍යාඥයින් දෙදෙනා විසින් මිනිස් මොළයේ එකිනෙකට වෙනස් කාර්යයන් කරන කොටස් දෙකක් ඇති බව බව සොයා ගැනීම යි. ඒ සඳහා ඔවුන් දෙදෙනාට නොබෙල් ත්‍යාගය පවා හිමිවිය.[5] මෙම නව සොයාගැනීමට අනුව මොළයේ වම් පාර්ශවයෙන් (Left Brain) වචන, තර්කය, පිළිවෙල, සංඛ්‍යා, විශ්ලේෂණය, ලැයිස්තුගත කිරීම් වැනි කාර්යයන් සිදුකරන අතර දකුණු මොළය (Right Brain) විනෝදය, නිර්මාණශීලිබව, රූප, වර්ණ, සංගීතය, සිතීම, රිද්මය වැනි කාර්යයන් නියෝජනය කරනු ලබයි.[6]




මෙම සංකල්පය ව්‍යාප්ත වීමත් සමඟ අධ්‍යාපනය සම්බන්ධ අධ්‍යාපනඥයින් හා මනෝ විද්‍යාඥයෝ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ දී ද මෙය භාවිත කිරීමේ යෝග්‍යතාවය අවධාරණය කරන්නට වූහ. ආවේදන ක්ෂේත්‍රය සංවර්ධනය කිරීමේ කර්තව්‍යයට ප්‍රමුඛස්ථානය ලබාදෙන සංගීත ගුරුවරයා මෙම සංකල්පයට අනුකූල ශිෂ්‍ය විවිධත්වය හඳුනා ගනී. ගුරුවරයා විසින් දකුණු මොළයේ ක්‍රියාකාරීත්වය ප්‍රබල සිසුන් දෘෂ්‍ය අවකාශමය බුද්ධියෙන් (Visual - Spatial Intelligence) යුක්ත වන බව ශාස්ත්‍රීය හා න්‍යායාත්මක දැනුම මෙන් ම ප්‍රායෝගික අත්දැකීම ඔස්සේ ප්‍රත්‍යක්ෂ කරගනු ලබන්නේ ය.

විශේෂයෙන් සංගීතය හදාරන සිසුන් භාවමය අංශයට නැඹුරු ය. ආගම හා අධ්‍යාත්මක පාර්ශවයට දැඩි කැමැත්තක් ඇති අතර අන්තර් පුද්ගල සබඳතාව හා සමාජ සබඳතාව ද ඉහළ මට්ටමකින් පවත්වාගනිති. සංගීතමය හැකියාව සඳහා ඍජු ලෙස ම දකුණු මොළයේ ක්‍රියාකාරීත්වය ඉවහල් වන බව අනාවරණය වී ඇති කරුණු ඔස්සේ අවබෝධ කොටගන්නා සංගීත ගුරුවරයා මේ බුද්ධිමය හැකියාව වර්ධනය කිරීම උදෙසා සංගීත ශ්‍රවණය, ඊට අනුරූපී චලන, තාල මානය, ගායනය, වාදනය, ස්වර රචනය හා නාද රිද්ම රටා නිර්මාණය ආදි විවිධ හැකියා ඉගැනුම් ඉගැන්වීම ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීමේ දී භාවිතයට ගනී.

## 03. ඉගැනුම් ශෛලිය (Learning Style)

සංගීතය වැනි ඉගැන්වීමේ දී ඉගැනුම් ශෛලිය නිසි අයුරින් පවත්වාගැනීමට සංගීත ගුරුවරයා නිබඳ ව කටයුතු කරයි. සංගීතය හදාරන ශිෂ්‍යයාගේ දකුණු මොළයේ ක්‍රියාකාරිත්වය වම් මොළයට වඩා ක්‍රියාකාරි වූවත්, එක් එක් ළමයාගේ සංජානන හැකියාව (Perception) මත ඉගැනුම් ශෛලිය ද වෙනස් කළ යුතු වේ. සංජානනය යනු තොරතුරු උකහා ගන්නා ප්‍රධාන මාර්ගය ගුරුවරයා විසින් බාහිරින් ලබාදෙන දැනුම අභ්‍යන්තරීකරණය කරගැනීම සංජානන ක්‍රියාවලියෙන් සිදුවේ. පසිඳුරන්ට හෙවත් ඉන්ද්‍රියයන්ට බාහිර යමක් ගෝචර වීම සංවේදනය (Sansation) නමින් ද ගෝචර වූ දෙය අර්ථකථනය, සංජානනය නමින් ද හැඳින්වේ.[6] මේ අනුව නිසි සංජානන ක්‍රියාවලියක් උදෙසා සංගීතය හදාරන ශිෂ්‍යයාගේ තොරතුරු උකහාගැනීමේ හැකියාවේ විෂමතාව අනුව විවිධ ශෛලි භාවිත කිරීමට සිදුවේ.

I. දෘශ්‍ය ශෛලිය
II. ශ්‍රව්‍ය ශෛලිය
III. ස්පර්ශ හා හසුරු කුසලතා ශෛලිය

### දෘශ්‍ය ශෛලිය - Visual Style

සංගීතය විෂය ඉගැන්වීමේ දී දෘශ්‍ය සාධකය අතිශය වැදගත් ය. මන්ද වාදනය කරන සෑම ශිෂ්‍යයෙකු ම තම ප්‍රවීණ ගුරුවරයාගේ වාදනය අනුකරණය කරමින් තම වාදන හැකියාව ප්‍රගුණ කරගන්නා සේ ම ගායනය හදාරන සෑම ශිෂ්‍යයෙකු ම ගායනයේ දී භාවිත වන

ඉංගිතයන්, භාවමය රූපණයන් හා ගායනයට ලබාදෙන සජීවී බව පිළිබඳ ව හදාරනු ලබන්නේ දෘෂ්‍ය සාධකයේ බලපෑමෙන් වන හෙයිනි.

සමස්ත අධ්‍යාපන ක්‍රියාදාමයේ දී ශිෂ්‍යයා 75% ක් උකහාගනු ලබන්නේ දෘශ්‍ය ශෛලිය උපයෝගී කරගෙන බව මනෝවිද්‍යාඥයෝ පෙන්වා දෙති. දෘශ්‍ය ශෛලියට ප්‍රමුඛතාවය ලබාදෙන දරුවා කවරෙකු දැ යි තේරුම් ගන්නා සංගීත ගුරුවරයා එම ශිෂ්‍යයාට නිශ්ශබ්ද ව කියවීම, රූප සටහන්, චිත්‍ර ආදිය පරිශීලනයෙන් ඉගෙන ගැනීමට වැඩි නැඹුරුවක් සපයන දෘශ්‍යාධාරක භාවිත කරයි. එහි දී ගුරුවරයා විසින් රූපක ආධාරයෙන් ඉගැන්වීම සඳහා ප්‍රස්තාර, රූප සටහන්, චිත්‍ර, පෝස්ටර්, වගු, පාඨග්‍රන්ථ, වීඩියෝ දර්ශන, උපරි ප්‍රක්ෂේපන (Overhead Projectors), දෘශ්‍ය මාධ්‍ය ප්‍රදර්ශක (Visual Presenters), බහුමාධ්‍ය ප්‍රදර්ශක (Multimedia Projectors), සිතුවම්, අත්පත්‍රිකා වැනි දෘශ්‍ය මෙවලම් උපයෝගී කරගනී.

උදාහරණ වශයෙන් වීණාව පිළිබඳ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සිදු කිරීමේ දී ඒ පිළිබඳ ව ලියවී ඇති ආශ්‍රේය ග්‍රන්ථ වෙත යොමු කිරීමත්, රුද්‍ර වීණාවේ රූප රාමු වෙත සිසුන් සමීප කිරීමත් සංගීත ගුරුවරයා විසින් සිදු කරනු ලබයි. දෘශ්‍ය ශෛලියට ප්‍රමුඛත්වය ලබාදෙන සිසුන් සඳහා වැඩි දැනුමක් සම්ප්‍රේෂණය කරවනුයේ කියවීමේ මාධ්‍යය උපයෝගී කොට ගෙන ය. එහි දී සංගීත ගුරුවරයා මනෝ සිතුවම් සැකසීමට (Mental Maps) දරුවාට හුරු කරවයි. විභාග සඳහා පාඩම් කිරීමේ දී වඩාත් වැදගත් කරුණු සඳහා යටින් ඉරි ඇඳීම, වර්ණ ගැන්වීම හා මතුකර දක්වන (High Lighters) මඟින් ඍජුව මනසේ තැන්පත් වන ආකාරයට සටහන් කරගැනීමට උගන්වයි. එමඟින් වඩාත් ඵලදායී ප්‍රතිඵල අත්කර ගනී.

## ශ්‍රව්‍ය ශෛලිය - Auditory Style

විද්‍යාත්මක පිළිගැනීම අනුව ඇසීම මඟින් දැනුම උකහාගන්නා ප්‍රතිශතය 13% කි. එහෙත් සංගීත විෂය හැදෑරීමේ දී මෙම ප්‍රතිශතය මීට ඉහළ අගයක් ගත හැකි ය. එසේ වන්නේ සංගීතය විෂය හුදෙක් ම ශ්‍රව්‍ය ගෝචර විෂයක් වන හෙයිනි. ශ්‍රව්‍ය ශෛලිය ගුරුකොට ගන්නා සිසුන් වැඩිපුර නැඹුරු වන්නේ පටිගත කර ඒවාට සවන් දී අභ්‍යාසකරණය සඳහා මෙන් ම සවන්දීමෙන් වැඩි තොරතුරු

ප්‍රමාණයක් උකහා ගැනීම සඳහා ය. මෙවැනි සිසුන් ගුරුවරයාගේ දේශන, සාකච්ඡා, දෙනු ලබන උපදෙස්, විධාන හා වාදන ගායන, සිදු කරනු ලබන සියලු ම අධ්‍යාපනික කොටස් තම ඉගෙනුම් මාධ්‍යය කරගනී. මෙවැනි සිසුන් ගුරුවරයා විසින් කලු ලෑල්ලේ යමක් ලියූ පමණින් ග්‍රහණය කරනොගන්නා අතර එය විග්‍රහ කිරීම සඳහා ශ්‍රවණ මාධ්‍යය උපයෝගී කොට ගනී. හින්දුස්තානි රාගධාරි සංගීත පද්ධතියේ එන ගායනය, වාදනය සඳහා උචිත රාග පිළිබඳ ව කාලය යන සාධකය පදනම් කොට නිර්මාණය වී ඇති 'ගායන සමය' නිර්ණය කරනු ලබන 'සමය චක්‍රය' උදාහරණයට ගෙන බලමු. මෙම චක්‍රය රූප සටහනක් ආකාරයෙන් කලු ලෑල්ලේ හෝ දෘෂ්‍ය ආධාරක මඟින් සිසුන් වෙත ප්‍රදර්ශනය කළ විට දෘෂ්‍ය ශෛලියට නැඹුරු සිසුවා එහි බොහෝ කොටස් වහ වහා ග්‍රහණය කරගත්ත ද, ශ්‍රව්‍ය ශෛලියට නැඹුරු සිසුවා එම රූප එකිනෙකින් විග්‍රහ කරදෙන ආකාරය ශ්‍රවණය කිරීමෙන් වටහා ගැනීමට වඩාත් කැමැත්තක් දක්වයි.

මෙවැනි සිසුන් බොහෝ විට සංගීත ගුරුවරයා ගායනය, වාදනය සිදු කරන විට පටිගත කිරීම් උපකරණයන් භාවිතයෙන් (Recorders) පටිගත කොට පුහුණුවේ යෙදීමෙන් විශිෂ්ටයන් බවට පත් වේ. එවැනි පටිගත කිරීම් සඳහා සංගීත ගුරුවරයා පැකිලීමකින් තොර ව දරුවාට ඉඩ හසර සලසා දේ. මෙවනි දරුවන් ගීත හා ශාස්ත්‍රීය ගායන ශබ්ද නඟා කීමෙන් හා අන් අයට ශබ්ද නඟා කියා දීමෙන් මානසික වශයෙන් ද තෘප්තියක් ලබයි. ධාරණය ද වැඩි දියුණු කරගනී.

## ස්පර්ශ ශෛලිය හා හසුරු කුසලතා ශෛලිය – Tactile Style & Kinesthetic Style

මෙම ඉගෙනුම් ශෛලිය ප්‍රශස්ත ඉගෙනුම් ශෛලියක් ලෙස සංගීත ගුරුවරයා වටහා ගනී. සංගීතය වැනි ප්‍රායෝගික විෂයක් ඉගැන්වීමේ දී සංගීත භාණ්ඩ ස්පර්ශ කිරීමෙන් ඒවා කොටස් වශයෙන් වෙන් කරමින්, එකලස් කරමින් රස විඳීමට සංගීත ගුරුවරයා අවකාශ සලසා දෙයි. ඔහු කිසිවිටෙකත් සංගීත භාණ්ඩයේ සුරක්ෂිතභාවය පමණක් නොසලකන අතර ඊ. එල්. තෝන්ඩයික්ගේ (1874 - 1949) තැත් වරද ක්‍රමයෙන් දරුවාට වැරදීමෙන් නිරවද්‍යතාවය සඳහා වන ස්වයං අධ්‍යයනයට අවස්ථාව උදාකර දෙයි.[7] සාමාන්‍ය

පන්ති කාමරයේ දී දේශන ක්‍රමවලට කොටු වූ දරුවන් අතරින් මෙවැනි දරුවන් බොහෝ සෙයින් ගුරුවරුන්ගේ දෝෂාරෝපණයට ලක් වන්නේ මහත් කරදරකාරී දරුවන් ලෙස ය. එසේ වන්නේ මෙවැනි දරුවන් අත්වලින් හා ක්‍රියාකාරී ව වැඩ කිරීමෙන් දැනුම උකහා ගන්නා හෙයිනි. ස්වකීය ඉගැනුම් ව්‍යවහාර පිළිබඳ පිළිවෙළින් සිතා ඒ අත්දැකීම්වලින් ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේදය සකසා ගන්නා සංගීත ගුරුවරයා මෙවැනි සිසුන් ඔවුන්ගේ ක්‍රියාකාරීත්වය අනුව වටහා ගනී. එසේ ම මෙවැනි සිසුහු සංගීත විෂයේ දී විශිෂ්ට කුසලතා දක්වති. වාදන භාණ්ඩ වැයීමට දස්කම් පාති. මෙවැනි සිසුන් සඳහා වයලීනය, තබ්ලාව, පියානෝව, ඕගනය, ඩ්‍රම්ස් ආදී වශයෙන් වන සංගීත භාණ්ඩ සඳහා යොමු කිරීම සංගීත ගුරුවරයා විසින් සිදු කරනු ලබයි. එසේ ම මෙවැනි සිසුහු අත්හදා බැලීමෙන් හා ස්පර්ශයෙන් ඉගැනීමට වැඩි ලැදියාවක් දක්වීම හේතුවෙන් ගායනය වැනි විෂයක් සඳහා නැඹුරුතාවක් දක්වීමට ඇතැම් විට පසුබට වෙති. මන්ද ක්‍රියාශීලි ව කටයුතු කිරීම ඔවුන්ගේ රටාව වන හෙයිනි. දේශනවල දී මෙවැනි සිසුන්ගේ නොසන්සුන් හැසිරීම සඳහා සූක්ෂම ලෙස ගුරුවරයා යෝජනා කරනුයේ සරල ක්‍රියාකාරකම් හා සියල්ල ලියා ගැනීමට යොමු කිරීමේ ක්‍රමවේදයන් ය. විද්‍යාත්මක පර්යේෂණ මඟින් ලබාගන්නා ලද නිරීක්ෂණවලට අනුව ස්පර්ශයෙන් (Touch) 6% ක් ද, ආඝ්‍රාණයෙන් (Smell) 3% ක් හා රස විඳීමෙන් (Taste) 3% ක් ද වශයෙන් සිසුන් දැනුම් අත්පත් කරගන්නා බව තහවුරු කර ඇත. සංගීත ගුරුවරයාගේ ඉගැන්වීම් ක්‍රියාවලියේ දී හා පාඩම් සැලසුම්කරණයේ දී ඉන්ද්‍රියන් කීපයකට ගෝචර වන අයුරින් පාඩම් සැලසුම් කරගැනීම මෙහි දී අතිශය ඵලදායි වේ.

## 04. සමස්ත (බහුවිධ) එළඹුම හා පියවරෙන් පියවර ඉගෙනුම් න්‍යාය (Holistic Approach & Serialist Approach Theory)

සංගීත විෂය ඉගැන්වීමේ දී ගුරුවරයා මෙම න්‍යායන් දෙක ම ක්‍රියාත්මක කරනු ලබන්නේ ඒ ඒ ශිෂ්‍ය කණ්ඩායමේ විෂය අවබෝධ කරගැනීමේ හැකියාව සැලකිල්ලට ගනිමිනි. සමස්ත (බහුවිධ) එළඹුම් ක්‍රමය යනු යම් සංකල්පයක් අවබෝධ කරවීමේ දී එම සංකල්පයේ සමස්තය වටහා දෙමින් ක්‍රමයෙන් අනෙකුත් අනු කොටස්වලට ප්‍රවේශ වීම යි. සංගීත විෂයේ දී රාග සංකල්පය ඉතා වැදගත් සංකල්පයකි.

මෙම සංකල්පය හින්දුස්තානි රාගධාරි සංගීතයේ හදවත බඳු ය. සංගීතය හැදෑරීමට පැමිණෙන ශිෂ්‍යයා මෙම රාග සංකල්පය එකවර අවබෝධ කර නොගනී. එහි දී සංගීත ගුරුවරයා වීඩියෝ දර්ශන හෝ ශ්‍රව්‍ය උපකරණ භාවිත කරමින් රාග රසක් ක්‍රමයෙන් ශ්‍රවණයට සලස්වා ඉන් රාගයක් ගෙන ක්‍රම ක්‍රමයෙන් එහි ආලාප කොටස්, විලම්භ ලය ඛ්‍යාල්, මධ්‍ය ලය ඛ්‍යාල් හා ධ්‍රැත ලය ඛ්‍යාල්, ස්ථායි, අන්තරා, තානාලංකාර, ඣාලා ආදී කොටස් ක්‍රමානුකූල ව ඉගැන්වීමෙන් ඉහළ සිට පහළට දනුම උකහා ගැනීමට කටයුතු සලස්ව යි. ඉගෙනීමට දක්ෂ සිසුහු සමස්ත එළඹුම් ක්‍රමයේ දී ආරම්භක අවස්ථාවේදී ම සමස්ත චිත්‍රය දැකීම හේතුවෙන් ඒ කරා ළඟා වීමට වඩා සක්‍රීය ව ක්‍රියා කරති.

සංගීතය හදාරන ශිෂ්‍ය ප්‍රජාව අතුරින් ඇතැම් පිරිසක් සමස්තය හෙවත් පූර්ණ රූපය එකවර දකීමෙන් ඉගෙනීමට උදාසීනත්වයක් දක්වති. මෙවැනි සිසුන් පාඩම් කෙරෙහි ආකර්ශණය කරගැනීම සඳහා භාවිත කරනු ලබන ක්‍රමවේදය වන්නේ පියවරෙන් පියවර ඉගෙනීම නම් වූ ඉගැනුම් න්‍යාය වේ. මෙම න්‍යායට අනුව ගුරුවරයා විසින් ශිෂ්‍යයා ඉගෙනුම් ඉගැන්වීම ක්‍රියාවලිය තුළ සක්‍රීය ව තබාගනු ලබන්නේ පියවර ක්‍රමයෙන් පහළ සිට ඉහළට ක්‍රමානුකූල ව ගෙන යමින් සමස්තය කරා ළඟා කරවීමෙනි. මෙවැනි දරුවන්ට රාග සංකල්පය අවබෝධ කරදීමට ක්‍රම ක්‍රමයෙන් රාගවල අඩංගු අනු කොටස්වල සිට සංකීර්ණ කොටස් දක්වා ඉගැන්වීමට ගුරුවරයා වගබලා ගනී. එබැවින් වයලීනය වැයීමට ප්‍රිය කරන සිසුවාට වයලීනයේ කොටස් හඳුන්වාදීමෙන් අරඹා ක්‍රමයෙන් වාදන ඉදිරිපත් කිරීමේ නිර්මාණශීලි ඉගැනුම් අරමුණ දක්වා යොමු කරනුයේ පියවරෙන් පියවර ඉගෙනුම් න්‍යාය යොදා ගනිමිනි.

## 05. ප්‍රතිවර්ත සිසුන් හා වහාම තීරණවලට එළඹෙන සිසුන් (Reflective Type - Impulsive Type)

නැවත නැවතත් සිතමින් බොහෝ සෙයින් කාලය මිඩංගු කරමින්, ස්ථිර තීරණයක් ගත නොහැකි ව ගැටලු විසඳීමේ දී අවිනිශ්චිත ස්වභාවයක් දරණ සිසුහු ප්‍රතිවර්ත සිසුහු වෙති. මෙවන් සිසුන් පිළිබඳ සංගීත ගුරුවරයා අවබෝධ කරගත් විට ඒ සඳහා තම

ඉගැනුම් ක්‍රමවේදය සකසා ගනී. උදාහරණ වශයෙන් ගිටාර් වාදන පාඩමක දී ගිටාරයේ තත් වාදනය කිරීමට තාල රටාවක් සිද්ධාන්තමය වශයෙන් උගන්වා pick (Plectrum) (ගිටරයක් හෝ තත් භාණ්ඩයක වයන ප්ලාස්ටික් හෝ කැස්බෑ ලෙලි පතුර)[8] භාවිතයෙන් වාදනය සඳහා අභ්‍යාසයක් (Strumming Pattern) දුන් විට මෙවැනි සිසුහු එසේ වාදනය කළහොත් තමාට විය හැකි අපහසුතා හා ඇති විය හැකි අනෙකුත් විකෘති නාද (Distortions) පිළිබඳ සිතමින් වාදනය නොකොට කල් ගෙවති. එවැනි අවස්ථාවක දී සංගීත ගුරුවරයා සිසුන් හා එක් ව එම කාර්ය ඉටු කිරීමට සහසම්බන්ධ ව ක්‍රියාකර ක්‍රමානුකූල ව ඉන් මිදීමට උපකාරි වේ.

ඇතැම් සිසුහු වහා තීරණවලට එළඹෙති. ඔවුන්ට ලබා දෙන මගපෙන්වීම යටතේ ක්ෂණික තීරණ ගැනීමටත්, ගත් තීරණය ක්ෂණික ව ක්‍රියාත්මක කිරීමටත් පෙළඹෙති. මෙවැනි සිසුහු ඉක්මනින් ගැටලු නිරාකරණයට ප්‍රවේශ වෙති. එහි දී තම තීරණය අනුව වහාම ක්‍රියාත්මක වීමේ දී නිවැරදි මෙන් ම වැරදීමේ සම්භාවිතාව ඉහළ අගයක් ගන්නා අතර නිවැරදි වෘත්තීය ගුරු මාර්ගෝපදේශකත්වය මෙහි දී වැදගත් වේ. වරද නිවැරදි කර ගැනීමට ගතවන්නේ ප්‍රතිවර්ත සිසුවාට සාපේක්ෂ ව ඉතා අඩු කාලයකි.

සංගීත ගුරුවරයාට මෙවැනි සිසුන් පහසුවක් සලසනු ලබන අතර ඔවුන්ගේ ස්වභාවය තේරුම්ගෙන ඊට උචිත සහය ලබා දීමෙන් ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සාර්ථක කර ගැනීමට හේතු වේ.

## 06. ඉලක්කවාදී සිසුන් හා අධෛර්යමත් සිසුන් (Task Oriented - Discouraged Students)

පන්ති කාමරයේ දී සංගීත ගුරුවරයාට මෙවැනි දරුවන් දෙකොට්ඨාසය ම මුණ ගැසේ. ගුරුවරයා විසින් මෙම දෙවර්ගය ම එක සමාන තලයකට ගෙන සමාජයේ චර්යාමය වෙනසක් සහිත ගුණාත්මක පුද්ගලයින් බවට පත් කරනු ලබයි. එම වැයමේ දී ඔහුට හමුවන ඉලක්කවාදී සිසුවා, ඉගෙනීමට උනන්දුවක් දක්වන හා ධෛර්ය සම්පන්න ව කැපවීමෙන් යුක්තව අධ්‍යාපන ක්‍රියාදාමයට සක්‍රීයව දායක වනු දැකිය හැකි ය.

මෙවැනි සිසුහු ස්වධීනව කටයුතු කරන අතර නිවැරදි මාර්ගෝපදේශන හමුවේ නොනැවතී ඉදිරියට ම ගමන් කිරීමට කටයුතු කරති. සංගීත ගුරුවරයාගේ නිබඳ අවධානය දිනා ගන්නා මෙවැනි සිසුහු ශාස්ත්‍රීය කරුණු ග්‍රහණයට මෙන් ම දක්ෂතා ඉදිරිපත් කරමින් ඉහල ලකුණු ලබාගැනීමට ක්‍රියා කරති. මෙවැනි දරුවන් සඳහා සංගීත ගුරුවරයා සුසාධ්‍යකරුවාගේ (Facilitator) භූමිකාව නිරූපණය කරයි.

ඇතැම් සිසුහු පැහැදිලි අනාගත දැක්මකින් තොර ව, කිසිදු උද්‍යෝගයකින් තොර ව අධෛර්යමත් ව කටයුතු කරති. අඩු ලකුණු ලබා ගනිති. මෙවැනි සිසුන්ගේ නිරන්තර සමාජශීලී පෙළඹීමත්, හාස්‍යයට හා උපහාසයට නැඹුරු වෙමින් කැපී පෙනෙන්නට දරණ උත්සහයත් කල් ඇති ව හඳුනා ගන්නා සංගීත ගුරුවරයා ප්‍රයෝගික ක්‍රියාකාරකම් මඟින් ඔවුන්ගේ සංයමයක් ඇති කරවීමට උත්සහ ගනී. එසේ ම දන්නා තැනින් අරඹා නොදන්නා තැන දක්වා ක්‍රමයෙන් යොමු කරවයි. මෙවැනි සිසුන්ගේ පවතින හීන ආත්ම ශක්තිය වර්ධනය වන පරිදි ධන උපස්ථම්භන සපයමින් අගය කරයි.

විෂය පෙළඹවීම ඇති කරයි. මොවුන්ගේ මනෝචාලක ක්‍රියාකාරිත්වය උපයෝගී කරගනිමින් සංගීත භාණ්ඩ වෙත අවධානය යොමු කරවමින් ක්‍රමයෙන් විෂය ග්‍රහණය සඳහා මඟ පෙන්වා ප්‍රතිපෝෂණ ක්‍රියාමාර්ග අනුගමනය කරයි.

## 07. සහයෝගී දරුවන් හා තරඟකාරිව තනි ව කටයුතු කරන්නන් (Collaborative and Competitive Students)

ගාර්ඩ්නර්ගේ දැක්මට අනුව අන්තර් පුද්ගල සබඳතා මනාව පවත්වා ගැනීමේ හැකියාව සහිත දරුවන් සමාජ බුද්ධිය සහිත දරුවන් වේ. ඔවුහු අන්‍ය සිසුන් සමඟ ඉතා සහයෝගයෙන් කටයුතු කරයි. සංගීත ගුරුවරයා මෙවැනි දරුවන් උපයෝගි කොටගෙන තනි ව හුදෙකලා ව සිටිමින් මිතුරන් අතරින් කොන්වන සිසුන් සමඟ දැනුම බෙදා හදා ගැනීමටත්, දන්නා කරුණු කියා දෙමින් අන්තර් පුද්ගල සබඳතා තර කර ගැනීමටත් අවස්ථා සලසා දේ. එහි දී ඉගෙනීමේ දී සිසුන් මුහුණ දෙන ගැටලු අවබෝධ කර ගැනීමටත් ගුරුවරයා සමඟ සහ සම්බන්ධයෙන් අදහස් හුවමාරු

නොකර ගන්නා හුදෙකලා සිසුන්ගේ ගැටලු වක්‍රකාරයෙන් ලබාගෙන ඊට අනුරූපී විකල්ප ක්‍රමවේද ඔස්සේ සමාජශීලීභාවය ගොඩනැගීමටත් උපකාර කරයි.

මීට අමතර ව තරඟකාරී ක්‍රියාකලාපයක් සහිත සවිඥානක ශිෂ්‍ය ප්‍රජාවක් ද සංගීත ගුරුවරයාට හමු වේ. මෙවැනි සිසුහු අන් සියල්ලන් අභිභවා යමින් තමන් වැඩි ම ලකුණු අත්පත් කර ගත යුතු යැයි සිතා තනි ව ම කටයුතු කරති. මෙවැනි සිසුහු කොතෙකුත් දස්කම් පෑව ද ආවේදන අරමුණු ඉටු කර ගැනීමේ දී ඉන් බැහැර ව ක්‍රියා කරති. එවැනි සිසුන් සඳහා සංගීත ගුරුවරයා විසින් වෘත්තියට අයත් දැනුම, කුසලතා සහ ශිල්පීය ක්‍රම යාවජීව වශයෙන් භාවිතයට ගනු ලැබේ. කණ්ඩායම් ක්‍රියාකාරකම් පැවරීමේ දී කණ්ඩායමේ සියලු සාමාජිකයින්ගේ අදහස් නියෝජනය වන පරිදි ඉදිරිපත් කිරීම් සඳහා යොමු කිරීම ඉන් ප්‍රධාන වේ. මීට අමතර ව සංගීත විෂය නායකයා වැනි නායකත්ව තනතුරු ලබා දෙමින් අනෙකුත් සිසුන් අතර සබඳතා පවත්වා ගැනීමට යොමු කරයි. එවැනි සිසුන්ගේ සාර්ථක උත්සහායන් සඳහා අර්ථවත් උපස්ථම්භන සැපයීම සිදු කරයි. ආරම්භයේ දී වන වැරදි නොසලකා හරිමින් ඒවා උපහාසයට ලක් නොකොට කණ්ඩායම් හැඟීම සංවර්ධනය වන පරිදි ප්‍රශංසාත්මක උපස්ථම්භන සපයනු දැකිය හැකි ය. එවිට එවැනි සිසුන් සමපදස්ථ (Peers) මිතුරන් අතර අගය කිරීම්වලට හා ගෞරවාදරයට පාත්‍ර වේ.

## සමාලෝචනය

අර්ථාන්විත අධ්‍යාපනයක් සැපයීමට සංගීත ගුරුවරයාගෙන් ලැබෙන දායකත්වය අපමණ ය. එහි දී සිසුන්ගේ ඉගැනුම් ශෛලිය හා සිසු පෞරුෂයන් පිළිබඳ ලබා ගන්නා නිවැරදි වැටහීම අනුව ඉගෙනුම් ඉගැන්වීම් ශෛලීය නිර්මාණය කර ගැනීමට ගුරුවරයා නිබඳ ව කැප වේ. සැමට සමබර අධ්‍යාපනයක් ලබා දීමට වෙහෙස ව ක්‍රියා කරයි. ජේ. පී. ගිල්පර්ඩ් ඉදිරිපත් කළ අපසරණ චින්තනය (Divergent Thinking) සංගීත ගුරුවරයා සතු ව ඇති හැකියාවකි. අපසරණ චින්තනය යනු යමක් ගැන විවිධ පැති දිශාවන් අනුව විවිධාකාරයෙන් සිතීම ය. මෙය නිර්මාණාත්මක චින්තනය වශයෙන් සැලකිය හැකි ය.[9]

සංගීත ගුරුවරයා පාඩම් සැලසුම් කිරීමේ දී මෙම අපසරණ චින්තනය උපයෝගී කොට ගනිමින් සිසුන්ගේ ආකර්ෂණය හා අවධානය දිනා ගත හැකි වන පරිදි පාඩම් සැලසුම් කරනු ලබයි. දරුවා ආරයෙන් රැගෙන එන ශක්ති සම්භාරය මතු කොට විකසිත කරලීමට කටයුතු කරනු ලබයි. එහි දී ආදර්ශන හා පරීක්ෂණ, ප්‍රශ්න හා සාකච්ඡා, කණ්ඩායම් ක්‍රියාකාරකම්, බුද්ධි කලම්භන ක්‍රියා හා දෘෂ්‍ය ආධාරක භාවිත කරමින් වෘත්තීය දැනුම හා විෂය දැනුම මනා ව කළමණාකරණය කොට ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සාර්ථක කර ගැනීමට කටයුතු කර යි. සංගීත විෂය ඉගැන්වීමේ අරමුණු සාධනය කරමින් සමාජ විරෝධාකල්ප හමුවේ ඉවසීමෙන් හා බුද්ධියෙන් ක්‍රියා කරන්නා වූ යහපත් ශිෂ්‍ය සමාජයක් බිහි කිරීමේ පෙර ගමන්කරු වශයෙන් ක්‍රියා කරන්නා වූ සංගීත ගුරුවරයා සකල ජන ගෞරවාදරයට පාත්‍ර විය යුතු ය.

## ආන්තික සටහන්

1. අබේපාල, රෝලන්ඩ්, (2010), සෞන්දර්ය අධ්‍යාපන විවරණ, කොට්ටාව, සාර ප්‍රකාශන, 180-181 පිටු.
2. එම, 183 පිටුව.
3. අතුකෝරාල, දයා රෝහණ, අතුකෝරාල, හේළි නිමලා, (2015), අධ්‍යාපන මනෝවිද්‍යාව හා ගුරුවරයා, කොළඹ, ශික්ෂා මන්දිර ප්‍රකාශන, 254 පිටුව.
4. අබේපාල, රෝලන්ඩ්, (2013), බුද්ධිය; බහුවිධ හා භාවමය බුද්ධිය, කොට්ටාව, සාර ප්‍රකාශන, 84 පිටු.
5. එම, 115 පිටුව.
6. අතුකෝරාල, දයා රෝහණ, (2013), සඵලවත් ගුරුවරයෙකු විය හැකි මඟ ධනාත්මක මනෝවිද්‍යා මඟ පෙන්වීමක්, කොළඹ, ශික්ෂා මන්දිර ප්‍රකාශන, 53 පිටුව.
7. අබේපාල, රෝලන්ඩ්, (2013), අධ්‍යාපනයේ මනෝවිද්‍යාත්මක පදනම, කොට්ටාව, සාර ප්‍රකාශන, 186 පිටුව.
8. මලලසේකර, ජී. පී, (2008), මලලසේකර ඉංග්‍රීසි - සිංහල ශබ්ද කෝෂය, කොළඹ, සීමා සහිත ඇම්. ඩී. ගුණසේන සහ සමාගම, 1091 පිටුව.
9. අබේපාල, රෝලන්ඩ්, (2010), සෞන්දර්ය අධ්‍යාපන විවරණ, කොට්ටාව, සාර ප්‍රකාශන, 245 පිටුව.

## මූලාශ්‍රය නාමාවලිය


අබේපාල, රෝලන්ඩ්, (2010), **සෞන්දර්ය අධ්‍යාපන විවරණ**, කොට්ටාව, සාර ප්‍රකාශන.

අතුකෝරාල, දයා රෝහණ, අතුකෝරාල, හේළි නිමලා, (2015), **අධ්‍යාපන මනෝවිද්‍යාව හා ගුරුවරයා**, කොළඹ, ශික්ෂා මන්දිර ප්‍රකාශන.

අබේපාල, රෝලන්ඩ්, (2013), **බුද්ධිය; බහුවිධ හා භාවමය බුද්ධිය**, කොට්ටාව, සාර ප්‍රකාශන.

අතුකෝරාල, දයා රෝහණ, (2013), **සඵලවත් ගුරුවරයෙකු විය හැකි මඟ ධනාත්මක මනෝවිද්‍යා මඟ පෙන්වීමක්**, කොළඹ, ශික්ෂා මන්දිර ප්‍රකාශන.

අබේපාල, රෝලන්ඩ්, (2013), **අධ්‍යාපනයේ මනෝවිද්‍යාත්මක පදනම**, කොට්ටාව, සාර ප්‍රකාශන.

මලලසේකර, ජී. පී, (2008), **මලලසේකර ඉංග්‍රීසි - සිංහල ශබ්ද කෝෂය**, කොළඹ, සීමා සහිත ඇම්. ඩී. ගුණසේන සහ සමාගම.

ජයවර්ධන, ආනන්ද, ජයවර්ධන, සීතා, (2013), **ඉගැන්වීම් පුහුණුව හා අධීක්ෂණය**, වරකපොල, ආරිය ප්‍රකාශන.

කාරියවසම්, සී, **ගුරුවරයා වෘත්තීය තත්වයට පත් කිරීම**, (2007), කොට්ටාව, සාර ප්‍රකාශන.

ගුණසේකර, පී. විජේසිරි, **සාර්ථක ගුරුවරයකු හා ඵලදායි විදුහල්පතිවරයකු වීමට**, (1996), නුගේගොඩ, සීමාසහිත දීපානි මුද්‍රණ/ප්‍රකාශන.

Minton, David**, Teaching skills in Further & Adult Education**, (1997), Basingstoke, Macmillan Press.